**13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය**

## නිපුණතා මට්ටම 11.3 - විචල්‍ය කිහිපයක සාපේක්ෂ වෙනස මැනීම සඳහා තනි දර්ශකයක් යොදා ගනියි.

**සරල සමාහාර දර්ශක -** පදනම් කාලච්ඡේදයකට සාපේක්ෂව සලකා බලන කාලච්ඡේදයේ දී සාධක කිහිපයක වෙනස් වීම එකවර නිරූපණය කිරීම සඳහා ගණනය කරනු ලබන තනි දර්ශක සරල සමාහාර දර්ශක නම් වේ.

සරල සමාහාර දර්ශක වර්ග තුනක් ලෙස මැනිය හැකිය.

1.සරල සමාහාර මිළ දර්ශකය

2.සරල සමාහාර ප්‍රමාණ දර්ශකය

3.සරල සමාහාර අගය දර්ශකය

**සරල සමාහාර මිළ දර්ශකය-**පදනම් කාලච්ඡේදයකට සාපේක්ෂව සලකා බලන කාලච්ඡේදයේ දී භාණ්ඩ හා සේවා දෙකක හෝ වැඩි ගණනක මිලෙහි වෙනස් වීම ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කිරීමෙන් ලැබෙන මිනුම සරල සමාහාර මිල දර්ශකය නම් වේ.

**සරල සමාහාර ප්‍රමාණ දර්ශකය**-පදනම් කාලච්ඡේදයකට සාපේක්ෂව සලකා බලන කාලච්ඡේදයේ දී භාණ්ඩ හා සේවා දෙකක හෝ වැඩි ගණනක ප්‍රමාණයන්හි වෙනස් වීම ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කිරීමෙන් ලැබෙන මිනුම සරල සමාහාර ප්‍රමාණ දර්ශකය නම් වේ.

**සරල සමාහාර අගය දර්ශකය**-පදනම් කාලච්ඡේදයකට සාපේක්ෂව සලකා බලන කාලච්ඡේදයේ දී භාණ්ඩ හා සේවා දෙකක හෝ වැඩි ගණනක වටිනාකමෙහි(අගයෙහි) වෙනස් වීම ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කිරීමෙන් ලැබෙන මිනුම සරල සමාහාර අගය දර්ශකය නම් වේ.

- පොදුවේ මිල මට්ටමේ,ප්‍රමාණයේ හෝ අගයේ ඇති වන වෙනස තනි දර්ශකයකින් මැන ගත හැකි වීම සරල සමාහාර දර්ශකවල ප්‍රයෝජන වේ.

නමුත් පහත දැක්වෙන දුර්වලතා ද සරල සමාහාර දර්ශකවල පවතී.

1.මෙම දර්ශක භාණ්ඩවල සාපේක්ෂ වැදගත්කම සැලකිල්ලට නොගැනීම

නිදසුනක් ලෙස ජීවන වියදම් දර්ශකයක් ගණනය කිරීමේ දී සීනි සහ ලුණුවලට සමබරක් පැවරේ.

2.භාණ්ඩය මනිනු ලබන ඒකක පිළිබඳව නොසලකා හැරීම.

නිදසුනක් ලෙස සීනි කිලෝග්‍රෑම්වලින් ද තෙල් ලීටර්වලින් ද රෙදි මීටර්වලින් ද මනිනු ලැබේ.එම ඒකක දර්ශකයේ අගයට බලපෑමක් කරයි.

**අභ්‍යාස**

2020 මැයි හා ජූනි මාසවලට අදාළ ව සාමාන්‍ය පවුලක් සතියකට පරිභෝජනය කරන ආහාර ද්‍රව්‍ය කිහිපයක මිළ ගණන් සහ ප්‍රමාණයන් පිළිබඳ දත්ත පහත දැක්වේ.

| භාණ්ඩ වර්ගය | මැයි | | ජූනි | |
|---|---|---|---|---|
| | ඒකක මිල p | ප්‍රමාණය q | ඒකක මිල p | ප්‍රමාණය q |
| සහල් (kg) | 80 | 10 | 90 | 08 |
| සීනි(kg) | 100 | 03 | 102 | 02 |
| පාන් (400g) | 50 | 08 | 60 | 07 |
| පෙට්‍රල් (ලීටර) | 150 | 20 | 120 | 25 |

සරල සමාහාර මිල දර්ශකය,සරල සමාහාර ප්‍රමාණ දර්ශකය,සරල සමාහාර අගය දර්ශකය ගණනය කරන්න.